ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.  ඔබේ අංකය / உமது இல. / Your No.  දිනය / திகதி / Date. 2025.04.08

පැමිණිලිකාර පාර්ශවය : ජේ.එම් සේනාධීර මයා,
10 - A ,
ශ්‍රී රතනපාල මාවත,
කයිලගොඩ,
බදුල්ල.

වගඋත්තරකාර පාර්ශවය :
1. ආණ්ඩුකාරවරයා,
ඌව පළාත් ආණ්ඩුකාර කාර්යාලය,
බදුල්ල.
2. ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
ඌව පළාත් සභාව,
බදුල්ල.
3. අධ්‍යාපන ලේකම්,
ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,
බදුල්ල.

**<u>පැමිණිලි අංකය : HRC/BD/66/24 - S</u>**

**<u>පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>**

පැමිණිලිකරු වන ජේ.එම් සේනාධීර යන අය විසින් ඉහත පැමිණිලි අංකය යටතේ 2024.04.01 දාතමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය දීප ව්‍යාප්ත සේවාවක් බවත්, ඕනෑම පළාතක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ධූරයේ පුරප්පාඩු පිරවිය යුත්තේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව පවත්වන සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත වුවත් ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ධූරය සඳහා ඒ.එච්.ආර් අමරදාස මහතා පත්කර ඇත්තේ ව්‍යවස්ථා විරෝධීව බවත්, එම තනතුර සඳහා විධිමත් පරිදි අයදුම්පත් කැඳවා විධිමත් සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත විධිමත්ව පත්කර නොමැති බවත් ය.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

එකම දිනයක පත්වීම් ලද දැනට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පළමු පන්තියට උසස් වීම් ලබා එහි අධි පන්තියටද යාමේ සුදුසුකම් ලැබූ නිලධාරීන් කිහිපදෙනෙක් සිටින බවත්, තමාද ඉන් එක් අයෙක් වන බවත්, ඒ.එච්.ආර් අමරදාස මහතාද ඉන් එක් අයෙක් බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත. තවද, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ධූරයට පත් කිරීමේ නීති ක්‍රමවේදය 2015/08/01 නිකුත් කළ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය ව්‍යවස්ථා සංග්‍රහයේ 25 A පිටුවේ දක්වා ඇති බවත් පැමිණිලිකරු විසින් දක්වා ඇත.

එසේම, 2022/12/16 දින ඌව පළාත ද ඇතුළත්ව පළාත් පහක් සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ධූරය සඳහා අයදුම්පත් කැඳවා තිබූ බව ද පැමිණිලිකරු කියා සිටී. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත ලකුණු පටිපාටිය ද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ නිලධාරීන් කිහිප දෙනෙක් විසින් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨතා ලේඛනයක් පෙන්වා දෙමින් තනතුරු සඳහා පත් කරගන්නා බව පෙනී යන බවත්, එකම දිනක සේවයට පත් වූ නිලධාරීන් කිහිපදෙනෙක් සිටින අවස්ථාවක ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත විධිමත් ලකුණු පටිපාටියකට අනුව තනතුරු සඳහා පත්කළ යුතු බවත්, මෙම අවිධිමත් පත් කිරීම නිසා සමාජ මාධ්‍ය ජාලාවල අනෙක් අය අවතක්සේරුවට ලක්ව ඇති බවත් ය.

ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ධූරය ලබා ගැනීම සඳහා පැමිණිලිකරු වෙත උපරිම සුදුසුකම් ඇති බවත්, එකී තනතුර නොලැබීමෙන් තම අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවත්, එසේ හෙයින් විධිමත් ක්‍රමවේදයකට අනුව තනතුරට සුදුසුම පුද්ගලයා තෝරා ගැනීමට අවශ්‍ය පසුබිම සකසා දෙන ලෙසත්, මේ සම්බන්ධව විමර්ශනයක් සිදු කර තමා හට ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ධූරය ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන ලෙසත්, පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙතින් ඉල්ලා ඇත .

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

මෙම පැමිණිල්ලට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මගින් වගඋත්තරකාර පාර්ශව වෙතින් වර්තා කැඳවීම සිදු කළ අතර ඒ අනුව,

**1 වන වගඋත්තරකරු වන ඌව පළාත් ආණ්ඩුකාරවරයාගේ කරුණු දැක්වීම**

1 වන වගඋත්තරකරු වන ඌව පළාත් ආණ්ඩුකාරවරයා වෙනුවෙන් ආණ්ඩුකාරවර ලේකම්වරයා විසින් අංක 1/3/HRC/01/2024 සහ 2024.04.17 දිනැති වාර්තාව ඉදිරිපත් කරමින්, දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 9 වන උපලේඛනයේ 1 ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුව) අංක 3 යටතේ අධ්‍යාපනය සහ අධ්‍යාපන සේවා දක්වා ඇති අතර III පරිශිෂ්ටය දක්වා ඇති ප්‍රමාණයට, අධ්‍යාපනය සම්බන්ධ බලතල පළාත් සභාව වෙත පවරා ඇති බවත්,

දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 (ඇ) ව්‍යවස්ථාව ප්‍රකාරව පළාත් සභාවක් විසින් ප්‍රඥප්ති සම්පාදනය කරනු ලැබිය හැකි කාරණාවලට ව්‍යාප්ත වන විධායක බලය, එම පළාත් සභාව පිහිටවනු ලැබූ පළාතේ ආණ්ඩුකාරවරයා විසින් 154(ඊ) ව්‍යවස්ථාවට අනුකූලව, කෙලින්ම හෝ පළාත්

අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් මාර්ගයෙන් හෝ සිය යටත් නිලධාරීන් මාර්ගයෙන් හෝ ක්‍රියාත්මක කළ හැකි බවත්,

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(1) වගන්තිය අනුව "වෙනත් යම් නීතියක විධිවිධාන වලට යටත්ව එක් එක් පළාතේ පළාත් සභා රජයේ සේවයේ නිලධරයන් පත් කිරීම, මාරු කිරීම සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය මෙයින් එම පළාතේ ආණ්ඩුකාරවරයා සතු කරනු ලබන්නේ ය" යනුවෙන් සඳහන් වේ. එකී 32 (1) වගන්තියෙහි ප්‍රතිපාදන සලසා ඇති පරිදි පළාත් රාජ්‍ය සේවයට අයත් තනතුරු පත්කිරීමේ බලය පළාත් ආණ්ඩුකාරතුමන්ලා සතුවන බවත්,

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කර ඇති අංක 1928/28 සහ 2015.08.21 දිනැති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ "5" පරිශිෂ්ටයේ සඳහන් පරිදි පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සාමාජිකයන් තුන්දෙනෙකුගෙන් යුත් (පළාත් ආණ්ඩුකාරවරයා විසින් නම් කරනු ලබන නියෝජිතයකුද ඇතුළත්ව) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශය මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පත්කරනු ලබන බව සඳහන්ව ඇති බවත්, එමගින් 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32(1) වගන්තිය මගින් ආණ්ඩුකාරතුමා වෙත ලබාදී ඇති බලතල අතර ගැටීමක් සිදුවන බව නිරීක්ෂණය වන බවත්, එබැවින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට සුදුසු නිලධාරියෙකු තෝරාගැනීම සඳහා පොදු එකඟතාවයක් පවතින ක්‍රමවේදයක් සකස් කර ගැනීමට ගරු ආණ්ඩුකාරතුමාගෙන් එකඟතාවය ඉල්ලා තිබූ බවත්, 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමා වෙත පැවරී ඇති බලතලවලට අභියෝගයක් වන බැවින්, එකී ලිපිය මගින් ඉල්ලා ඇති එකඟතාවය සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ එකඟතාවය ලබාදී නොමැති බවත්,

මෙම කරුණු පාදක කොටගෙන පුරප්පාඩුව පැවති ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ 2023.01.16 දින සිට වැඩ බැලීමේ පදනම මත කටයුතු කරන ලද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරී ඒ.එච්.ආර් අමරදාස මහතා 2024.03.20 දිනැති ලිපිය මගින් වහාම ක්‍රියාත්මක වන පරිදි ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට ගරු ආණ්ඩුකාරතුමාගේ බලතල ප්‍රකාරව පත් කර ඇති බවත් සඳහන් කර ඇත.

**2 වන වගඋත්තරකරු වන ඌව පළාතේ ප්‍රධාන ලේකම්වරයාගේ කරුණු දැක්වීම**

ප්‍රධාන වශයෙන් ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් මෙම පත්වීම සිදුකර ඇති බවත්,

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු අඛණ්ඩව විධිමත්ව සහ සාර්ථකව පවත්වාගෙන යාම සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමේ පත්වීමක් වෙනුවට ස්ථිර පත්වීමක් ලබාදීමේ අවශ්‍යතාව සලකා බලා සහ අමරදාස මහතාගේ පූර්ව සේවා කාලය තුළ ඌව පළාතේ වෙසෙන දූවාදරුවන්ගේ අධ්‍යාපන කටයුතු සම්බන්ධ ප්‍රගතිය සලකා බලා ඒ.එච්.ආර් අමරදාස මහතා පළාත්

අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට ස්ථිරව පත් කිරීමට පත්වීම් බලධාරියා වන ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් කටයුතු කර ඇති බවත්,

ඌව පළාතේ සමස්ත පාසල්වල පරිපාලන යාන්ත්‍රණය අඛණ්ඩව හා ශක්තිමත්ව පවත්වාගෙන යාම සඳහා ඒ සම්බන්ධව ප්‍රායෝගික හැකියාවන් සහිත නිලධාරියකු පත් කර ගැනීමේ අවශ්‍යතාව මත ආණ්ඩුකාර තුමා විසින් ඔහුට බව පැවරී ඇති බලතල ප්‍රකාරව පත්වීම් බලධාරියා ලෙස නීත්‍යානුකූලව අදාළ ස්ථිර පත්වීම සිදුකර ඇති බව නිරීක්ෂණය වන බව දක්වා ඇත.

**3 වන වගඋත්තරකරු වන ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කරුණු දැක්වීම**

ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් වාර්තා කරන පරිදි ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ ලෙස සේවය කළ ඩී.එම් රත්නායක මහතා විශ්‍රාම ගිය පසු පුරප්පාඩු වූ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා, අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරුවල සේවය කරන ලද ඒ.එච්.ආර් අමරදාස මහතා හා ජේ.එම් සේනාධීර මහතා යන දෙදෙනාට 2023.01.16 වන විට වසර පහක සේවා කාලයක් නොමැති බැවින් හා දෙදෙනාගේම සුදුසුකම් සමාන බැවින්, ඔවුන් දෙදෙනා අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරුවලට පත් කිරීමෙන් අනතුරුව පවත්වන සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ධූරයේ වැඩ බැලීමට පත්කරන ලෙස ආණ්ඩුකාරතුමන්ගෙන් ඉල්ලා සිටි බවත්,

ඒ අනුව, ආණ්ඩුකාරතුමාගේ 2023.01.16 දිනැති ලිපිය මඟින් ඒ එච්.ආර් රෝහිත අමරදාස මහතා වැඩ බලන පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක ලෙස පත්කළ බවත්,

ඒ අනුව, රෝහිත අමරදාස නිලධාරියා පූර්ණකාලීනව වැඩ බැලීමට පත් කිරීමට ඔහු විසින් නිර්දේශ කර 2024.02.19 දින ප්‍රධාන ලේකම්තුමිය වෙත ලිපියක් යොමු කළ බවත්, ආණ්ඩුකාරතුමන්ගේ 2024.03.20 දින ලිපිය මගින් ඒ.එච්.ආර් අමරදාස මහතා ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට පත්කරන ලද බවත් සඳහන් කර ඇත.

කෙසේ වෙතත්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට විධිමත්ව පත්කරනුයේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ 5 පරිශිෂ්ඨයේ අංක 05 ප්‍රකාරව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ වසර 05කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරන ලද සාමාජිකයන් තුන්දෙනෙකුගෙන් යුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් බවත් දක්වා ඇත.

එහෙත් 1987 අංක 12 දරණ පළාත් සභා පනතේ 4 වෙන කොටසේ 32 (1) වගන්තිය ප්‍රකාරව පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් පත්කිරීම, මාරු කිරීම, සේවයෙන් පහකිරීම සහ ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධයෙන් බලය පළාත් ආණ්ඩුකාරයා සතු වෙන බවත්, ඌව පළාතේ පාසල් 897 ක් ඇති අතර එකී සමස්ත පාසල්වල පරිපාලන යාන්ත්‍රණ අඛණ්ඩව හා ශක්තිමත්ව කරගෙන යාම සඳහා ඌව පළාත්

ආණ්ඩුකාර තුමාගේ බලතල ප්‍රකාරව ඒ.එච්.ආර් මහතා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ලෙස පත්කර ඇති බවත්,

පැමිණිලිකරු පැමිණිල්ල මගින් ඉදිරිපත් කර ඇති ලකුණු ලේඛනය විධිමත් සම්මුඛ පරීක්ෂණයක ලකුණු නොවන බව නිරීක්ෂණය වන බවත්, ඔහු කුසලතාවයෙන් ඒ.එච්.ආර් අමරදාස මහතාට වඩා ඉහළ මට්ටමක සිටින බව පැවසීම නීත්‍යානුකූල නොවන බවත්,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති පැමිණිල්ලේ වගඋත්තරකරු ලෙස ආණ්ඩුකාර තුමා නම් කර නොමැති බවත්, පත් කිරීමේ බලධාරියා වන්නේ ගරු ආණ්ඩුකාරතුමා බවත් පෙන්වා දෙන අතර මෙකී නිරීක්ෂණ අනුව රෝහිත අමරදාස මහතා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ලෙස නම් කිරීම ඌව පළාත් ආණ්ඩුකාරතුමන්ගේ බලතල අනුව සිදු වූ බව පෙන්වා දෙන බවත් දන්වා ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම් සම්බන්ධයෙන් පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති විරෝධතා</u>

ඉහත කී වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කළ කරුණු සම්බන්ධයෙන් තමාගේ එකඟතාවයක් නොමැති බවත්, 13 වෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ නමවන උපලේඛනයේ (1 ලැයිස්තුව පළාත් සභා ලැයිස්තුව) අංක 3 යටතේ අධ්‍යාපනය හා අධ්‍යාපන සේවා යටතේ දක්වා ඇත්තේ, III වන පරිශිෂ්ඨයේ දක්වා ඇති ප්‍රමාණයට අධ්‍යාපනය යනුවෙන් බවත්,

කරුණු ගණනාවකින් යුත් මෙම ලේඛනයේ කිසිදු අංකයක් යටතේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ තනතුරුවලට අදාළව උසස් කිරීම හෝ පත්කිරීම සඳහා බලයක් ලබාදී නොමැති බවත්, III පරිශිෂ්ටය අංක 3 යටතේ නිලධරයන් මාරු කිරීම හා ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධයෙන් සඳහන් කරුණු හැර වෙනත් කිසිදු තැනක පත්කිරීම් සම්බන්ධයෙන් කිසිවක් සඳහන්ව නැති බවත්,

154 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව ආණ්ඩුකාරවරයාට බලය ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ නියම කර ඇති තාක් දුරට බවත්, 154 (2) ව්‍යවස්ථාව ප්‍රකාරව ආණ්ඩුකාරතුමාට තම අභිමතය ක්‍රියාත්මක කළ හැක්කේ ජනාධිපතිවරයාගේ විධානය මත බවත්,

ඒ අනුව, ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ පත්කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට ජනාධිපතිතුමන්ගේ විධානයක් ගෙන තිබේද, විධානයක් නිකුත් කර තිබේදැයි, කවර ආකාර විධානයක් ද යන්න පැමිණිලිකරු විසින් විමසා ඇත.

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ධූරයට පත් කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ස්වාධීන කොමිෂන් සභා යටතේ රාජ්‍ය සේවා කොමිසමට බලය පවරා ඇති බවත්, නිශ්චිත බලය පවරා තිබෙන කරුණු සම්බන්ධයෙන් ආණ්ඩුකාරතුමාගේ අභිමතය ක්‍රියාත්මක කිරීමක් ගැන එහි සඳහන් නොවන බවත්,

ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ධූරයට පත් කිරීම සම්බන්ධයෙන් නිශ්චිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇති බවත්, ඒ සඳහා නිශ්චිත මඟ පෙන්වීම සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා

ව්‍යවස්ථාව ගැසට් කොට ප්‍රකාශයට පත් කර ඇති බවත්, තවත් අවශ්‍ය මග පෙන්වීම් සඳහා 2022 (1) චක්‍රලේඛය ද ඇති බවත්, එම නිසා 154 (ඊ) අංක 02 කරුණ මේ හා නොගැළපෙන බවත්,

ආණ්ඩුකාරවර ලේකම් දක්වා ඇති පරිදි 1987 අංක 42 පළාත් සභා පනතේ 32 (1) වගන්තිය යටතේ ආණ්ඩුකාරවරයාට ඇති බලතල මත ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක ධූරයට පත් කිරීම සාධාරණ බව පෙන්වා දුන්නත් 32 (1) වගන්තිය අනුව එහි සඳහන්ව ඇත්තේ "පළාත් සභා රජයේ සේවය" යනුවෙන් බවත්, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය පළාත් සභා රජයේ සේවයට අයත් නොවන බවත්,

32 (1) වගන්තියට අනුව එය බලපානු ලබන්නේ පළාත් සභා රජයේ සේවයේ නිලධාරීන් සඳහා වන බවත්, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය පළාත් සභා රාජ්‍ය සේවයක් නොවන බවත්, එම පත් කිරීම පළාත් ආණ්ඩුකාර තුමා විසින් සිදු කළ යුතු කටයුත්තක් නොවන බවත් පෙන්වා දෙන අතර ඒ සඳහා, පළාත් රාජ්‍ය සේවා කොමිසම සමඟ පොදු ක්‍රමයක් ගොඩනගා ගැනීම සඳහා එකඟතාවයක් ගරු ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලා සිටිය යුතු නොවන බවත්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ධූරයේ ප්‍රධාන වගකීම වන්නේ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ජාතික වගකීම දැරීම වන බවත්,

පළාත් අධ්‍යාපන ප්‍රඥප්තියක් සකසා තිබේ නම් එය ජාතික අධ්‍යාපන ප්‍රඥප්තියට යටත්ව ඊට හානි නොවන සේ පළාතට ගලපාගෙන ක්‍රියාත්මක කළ යුතු බවත්, ජාතික වගකීමෙන් බැඳෙන ප්‍රධාන තනතුරක් වූ ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ධූරයට ඒ.එච්.ආර් අමරදාස මහතා පත්කිරීම ගරු ආණ්ඩුකාර තුමාගේ තනි මතයට කළ නොහැකි දෙයක් බවත්,

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු පත් කළ යුත්තේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට බව පෙන්වා දෙන බවත්, එම සම්මුඛ පරීක්ෂණ කමිටුවේ සාමාජිකයන් තුන්දෙනාගෙන් එක් අයෙක් පළාත් ආණ්ඩුකාරවරයාගේ නියෝජිතයෙක් ලෙස නම් කිරීමට අවකාශ සලසා ඇත්තේ එතුමාගේ පළාත් අධ්‍යාපන ප්‍රඥප්තිය ක්‍රියාවට නැගීම සඳහා සහය වනු පිණිස බවත්,

අධ්‍යාපනය පළාත් සභා විෂයක් නොවන අතර ජාතික ප්‍රතිපත්තියක් වන බවත්, ජාතික අධ්‍යාපන කොමිෂම රටේ අධ්‍යාපන ප්‍රඥප්ති සකසන අතර, සියලුම පළාත් ක්‍රියාත්මක කළ යුත්තේම පොදු අධ්‍යාපන ප්‍රතිපත්ති වන බව ප්‍රතිපත්ති තුළ දක්වා ඇති බවත්, එකී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, නියාමනය සහ පසු විපරම කළ යුත්තේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් වන නිසා එම තනතුර පළාත් සභා විෂයක් නොවන බවත්,

පළාත් සභා විෂය සීමාව උපලේඛනය අංක 3 යටතේ III පරිශිෂ්ටය යටතේ දක්වා තිබෙන බවත්,

එම පරිශිෂ්ටයේ අංක තුනෙහි සඳහන් සීමාවන්ට පමණක් සීමා වී මාරු කිරීම හා විනය පාලනය පමණක් සිදුකිරීමට ආණ්ඩුකාරතුමාට අවකාශ ඇති බවත්,

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ධූරයට පත් කිරීම සඳහා බලතල ප්‍රකාරව විධිමත්ව අයදුම්පත් කැඳවා කොළඹ රාජ්‍ය සේවා කොමිෂම එකල දැන්වීම ඉදිරිපත් කර තිබූ බවත්, විධිමත්ව පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පළාත් පහක් වෙනුවෙන් අයදුම්පත් 2022.12.16 දිනට කැඳවූ බවත්, ඒ අනුව නිසි සම්මුඛ පරීක්ෂණයක්

පවත්වා ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු පත්කර තිබූ බවත්, පසුව එය වෙ
ක්‍රමවේදයට පත් කරන තෙක් වැඩ බැලීම සඳහා ජේ.එච්.ආර් අමරදාස මහතා 20
බැලීමට පත්කර තිබුණු බවත්, ඔහුට ඇති සුදුසුකම් පරීක්ෂා කරන ලද්දේ පළාත් අධ්‍ය
ද ජාතික අධ්‍යාපන ප්‍රඥප්තිය මගින් ද යනුවෙන් විමසා සිටින බවත්,

ආණ්ඩුකාර තුමාගේ අභිමතය මත කිසිදු සුදුසුකමක් පිළිබඳ නොසලකා නොබලා පුද්ග
පත්වීම සිදු කර ඇති බවත්,

අවසාන වශයෙන් පළාත තුළ යම් නිලධාරියෙක් පත් කළ යුතු යැයි පළාත් ආණ්ඩුකාරතුමාට අ
නම් පළාත් නිලධාරීන්ගේ වගකීම වන්නේ පළාත තුළින් අයදුම් පත්‍ර කැඳවා ජාතික ලකුණු ල
පටිපාටිය අනුගමනය කිරීම බවත් පැමිණිලිකරු විසින් සිය විරෝධතා තුළින් ඉදිරිපත් කර ඇත.

**<u>නිරීක්ෂණ සහ නිගමනය</u>**

මෙම පැමිණිල්ලට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2024.05.29 වන දින පවත්වන ලද පරීක්ෂණයේ දී පැමිණිලිකාර පාර්ශවය සහ වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කළ වාචික කරුණු දැක්වීම් අනුව සළකා බැලීමේ දී, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2022.12.02 වන දින 'ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා පත් කිරීම 2022' යනුවෙන් සඳහන් කරමින් දකුණ, නැගෙනහිර, ඌව, සබරගමුව සහ උතුර යන පළාත් පහ සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවා ඇති බව නිරීක්ෂණය වේ.

ඊට අදාළව 2023.04.18 වන දින පැවති සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත එන්.ඩී. ආර්. හේමන්ත යන අය ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට තෝරා පත් කරගෙන ඇති බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ ලේකම්වරයා විසින් එම තැනැත්තා වෙත දැනුම් දී ඇතත් ඔහු විසින් එකී තනතුරෙහි වැඩ භාරගැනීමක් සිදු කර නොමැති බව අනාවරණය වේ.

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 11.1 වගන්තිය ප්‍රකාරව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ධූරයට පත් කිරීමේදී එකී තැනැත්තා විසින් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ සේවය කළ ඩී.එම්. රත්නායක මහතා 2022.12.31 වන දින විශ්‍රාම ගැනීමෙන් අනතුරුව එකී තනතුර පුරප්පාඩුව පැවති බව වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම් තුළින් නිරීක්ෂණය වේ.

හෙයින් 3 වන වගඋත්තරකරු වන ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අංක /2/4/2 සහ 2023.01.13 දිනැති ලිපිය ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කරමින්, ඌව ළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරුවල සේවය කරන ලද .එච්.ආර් අමරදාස මහතා හා පැමිණිලිකරු වන ජේ.එම් සේනාධීර මහතා යන දෙදෙනා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියට පත්ව ඇත්තේ 2019.03.12 දින වන බැවින් ඔවුන් දෙදෙනාම ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට පත් කිරීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම වන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම යන සුදුසුකම ඒ වන විට සම්පූර්ණ කර නොමැති නිසා සම්මුඛ පරීක්ෂණයක් පවත්වා එහි ප්‍රතිඵල මත එම දෙදෙනා අතරින් එක් අයෙකු ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ධූරයේ වැඩ බැලීමට පත්කරන ලෙස ආණ්ඩුකාරතුමන්ගෙන් ඉල්ලා සිට ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව, ඌව පළාත් ආණ්ඩුකාරවර විසින් අංක 1/8/1/5-1 සහ 2023.01.16 දිනැති ලිපිය මඟින් ඒ.එච්. ආර්. අමරදාස මහතා ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම සඳහා පත් කර ඇති බවත්, එම පත්කිරීමට අදාළව කිසිදු සම්මුඛ පරීක්ෂණයක් පවත්වා නොමැති බවත් නිරීක්ෂණය වේ. ඉන් අනතුරුව ඌව පළාත් ආණ්ඩුකාරවර විසින් අංක 1/8/1/4-1 සහ 2024.03.20 දිනැති ලිපිය මඟින් ඒ.එච්. ආර්. අමරදාස මහතා ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා පත් කර ඇති බව පෙනී යයි. 2024.03.20 වන දින වන විට ඒ.එච්.ආර්. අමරදාස මහතා, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට පත් කිරීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම වන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම යන සුදුසුකම සම්පූර්ණ කර ඇති බව නිරීක්ෂණය වේ.

එලෙස පත්වීම ලබා දැනට ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරෙහි සේවයෙහි නියුතු ඒ.එච්.ආර්. අමරදාස මහතා විසින් අංක ඌප/අධ්‍යා/විමර්ශන/01/25/මානව හිමිකම් සහ 2025.03.25 දිනැති ලිපිය කොමිෂන් සභාව වෙත යොමු කරමින් මෙම පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කර ඇත. ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අංක 1/8/1/4-1 සහ 2024.03.20 දිනැති ලිපියට අනුව තමා ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා පත් කරන ලද බවත්, එම දිනයේ සිට මේ දක්වා ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට අදාළ රාජකාරී සහ වගකීම් නොපිරිහෙලා ඉටු කරමින් තම රාජකාරී කටයුතු සිදු කරන බවත්, තමා 2025.12.19 වන දින සේවයෙන් විශ්‍රාම යාමට නියමිත බවත් ඒ.එච්.ආර්. අමරදාස මහතා විසින් සිය ලිපියෙහි සඳහන් කර ඇත.

ඒ අනුව ඉහත කී පරිදි ඌව පළාත් ආණ්ඩුකාරවර විසින් අංක 1/8/1/4-1 සහ 2024.03.20 දිනැති ලිපිය මඟින් සිය අභිමතය පරිදි ඒ.එච්.ආර්. අමරදාස මහතා ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා පත් කර ඇති බව නිරීක්ෂණය වේ.

එහෙත්, අංක 1928/28 සහ 2015.08.21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ඇතුළත් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවේ '5' පරිශිෂ්ඨය ප්‍රකාරව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයින් 03 දෙනෙකුගෙන් යුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් නිලධාරීන් තෝරා පත් කරගනු ලබන බවත්, පළාත් ආණ්ඩුකාරවරයා විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු ද එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් තිදෙනා අතරට අයත් වන බවත් දක්වා ඇත. එහි වැඩිදුරටත් සඳහන් වන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ලකුණු පරිපාටියකට අනුව මෙම නිර්දේශ කිරීම කරනු ලබන බවයි. එසේම, එකී ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා පත්කිරීමට බලය ඇත්තේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බව ද සඳහන් කර ඇත.

ඒ අනුව ඉහත කී පරිදි ඌව පළාත් ආණ්ඩුකාරවර විසින් අංක 1/8/1/4-1 සහ 2024.03.20 දිනැති ලිපිය මගින් සිය අභිමතය පරිදි ඒ.එච්.ආර්. අමරදාස මහතා ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා පත් කිරීම තුළින් ඉහතින් දක්වන ලද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවේ සඳහන් ප්‍රතිපාදන උල්ලංඝණය වී ඇති බව තහවුරු වේ.

ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට පත් කිරීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම වන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම යන සුදුසුකම, ඉහත කී එකී තනතුරට ඌව පළාත් ආණ්ඩුකාරවර විසින් පත් කරන ලද ඒ.එච්.ආර්. අමරදාස මහතා සහ පැමිණිලිකරු වන ජේ.එම් සේනාධීර මහතා විසින් සම්පූර්ණ කරගෙන ඇත්තේ එකම දිනයක දී එනම්, 2024.03.12 වන දිනයේ දී වන බවත්, ඔවුන් දෙදෙනාම ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරුවල සේවය කර ඇති බවත් නිරීක්ෂණය වේ. 3 වන වගඋත්තරකරු වන ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අංක 9/ආ/2/4/2 සහ 2023.01.13 දිනැති ලිපිය ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කරමින් සඳහන් කර ඇත්තේ ද මෙම නිලධාරීන් දෙදෙනාම එක හා සමාන සුදුසුකම් වලින් සමන්විත වන බවයි.

ඒ අනුව ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට පත් කිරීම සඳහා නිසි ක්‍රමවේදය යටතේ විධිමත් සම්මුඛ පරීක්ෂණයක මණ්ඩලයක් පත් කර එහි නිර්දේශ මත අදාළ පත් කිරීම සිදු නොකිරීම තුළින් පැමිණිලිකරු වන ජේ.එම් සේනාධීර මහතා හට තනතුරට අදාළ මූලික සුදුසුකම් තිබිය දී එකී තනතුර සඳහා අයදුම් කිරීමට අවකාශයක් ලැබී නොමැති බව තහවුරු වේ. ඒ අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුතු බවට වන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම 1 වන වගඋත්තරකරු විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

එසේහෙයින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවතින ක්‍රමවේදයන්ට අනුකූලව විධිමත් පරිදි අයදුම්පත් කැඳවා නිසි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් විධිමත් පරිපාටිය ප්‍රකාරව සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා සුදුසුකම්ලත් නිලධාරියෙකු තෝරා පත් කිරීමට කටයුතු කළ යුතුව ඇත.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී .පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

| | | | |
|---|---|---|---|
| පිටපත් :- 01. | අමාත්‍යතුමිය,<br>අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය, බත්තරමුල්ල. | - | කරුණු දැනගැනීම සඳහා |
| 02. | ලේකම්,<br>රාජ්‍ය සේවා කොමිෂන් සභාව,<br>අංක 1200/9, රජමල්වත්ත පාර,<br>බත්තරමුල්ල. | - | කරුණු දැනගැනීම සඳහා සහ අවශ්‍ය සුදුසු පියවර ගැනීම සඳහා |